සිංහල භාෂාව හා සාහිත්‍යය- 2021 නිවාඩු කාලීන පැවරුම්
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය-බණ්ඩාරවෙල

07 වන ශ්‍රේණිය කාලය පැය 02 යි

- පෙළ පොතේ **මේ** පාඩම කියවා පිළිතුරු ලියන්න.
- සෑම ප්‍රශ්නයකම පිළිතුරු වරහන් තුළ ඇත. එය යටින් ඉරක් අඳින්න.



**1- මේ පින්තූරයේ දැක්වෙන පාඩමේ නම ලියන්න.**-------------------------------------------

(ගොවි බිරියගේ නුවණ/සසුන බැබළවූ සරණංකර සඟරජ තෙරණුවෝ/කතා බහට සංයමයක්)

**2-** විවේක කාලය අවසන් වූ බව දැනුම් දෙන සීනුව නාද වීමත් සමග ගුරුතුමිය පන්තියට පැමිණියා ය. ඉන් පසුව ගුරුතුමිය කළ දේ ලියන්න. ----------------------------------------

(සංවාදය ඉදිරිපත් කිරීම/ අභ්‍යාස බැලීම/ සිසුන් සමග රංගනයේ යෙදීම)

**මේ ඡේදයේ ඇති අතීත කාල ස්ත්‍රී ලිංග ක්‍රියා පදයක් ලියන්න.**-------------------

(ගුරුතුමිය / පැමිණියා ය. / ලියන්න. )

**3-** “මගේ චූටි පුතාටත් දුම්රිය පොළේ රස්සාවක් ඕනෑ ලු. ඔව්, ඔයාටත් එයත් එක්ක වැඩ කරන්න පුළුවන්.” මෙසේ කියන්නේ කවුද?---------------------------------------------

(ටොට්ටෝ චං / ටිකට් එකතු කරන්නා / මව)

**ඡේදයේ ඇති ප්‍රාණවාචී නාම විශේෂණ පදයක් ලියන්න.**--------------------------------

(චූටි පුතා / දුම්රිය පොළේ / කරන්න පුළුවන්.)

**4-** “ඔත්තු බලන ගමන් ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරි ද?” මෙසේ අසන්නේ කවුද? ----------------------------------------------------------------

( ටිකට් එකතු කරන්නා / ටොට්ටෝ චං / මව)

මේ වැකියේ ඇති **ක්‍රියා අර්ථ** ප්‍රකාශ වන පද දෙකක් ලියන්න. ------------------

( බලන, විකුණන/ ටිකට්, ඔත්තු/ කවුද, මට )

**5-** “පුතා, උඹ යන්ට කැමති ද නුවර?” මෙහි පුතාගේ නම ලියන්න------------------

( නිමල් / ටොට්ටෝ චං ,/ අමල් )

මෙහි **උඹ** යන පදය -උත්තම පුරුෂ පදයකි. මධ්‍යම පුරුෂ පදයකි. ප්‍රථම පුරුෂ පදයකි,

**6-** “ඔව්, ගිහින් වරෙන්. නැත්තං කුමාරිහාමිලා තරහ වෙයි.” මෙසේ කියන්නේ කවුද?------------

( නිමල් / අප්පච්චි/ මව )

මෙහි ඇති **අවසාන ක්‍රියා** පදය ලියන්න---------------- (වරෙන් / වෙයි/ කියන්නේ )

7- “නෑ මං කතා කළේ මල් පාත්තිය බලා ගන්න කියන්න.” මල් පාත්තිය බලා ගන්න කියන්නේ කාටද?------------------- ----------- (අක්කට/ අප්පච්චිට / මවට)
**මේ ඡේදයෙහි යෙදී ඇති පූර්ව ක්‍රියා පදයක් සොයා ලියන්න**-------------------------
(කතා / බලා / කියන්න )

8- “ඕක තමයි. මම ඊයේ රෑත් කිවුවේ, ගෙන යන ඒවා හොඳ සිහියෙන් දාගන්න කියලා” මෙහි මම යනු කවුද?------------------------------- (අක්කා/ අප්පච්චි / මව)

9- “ඒ කටයුතු අහවර වුණා ම ආවාස ගෙට ඇවිත් මාව බැහැ දකින්ඩ කියනවා හොඳයි. පොඩි හාමුදුරුවෝ පූජාවට වඩියි.” මෙහි මාව යනු කවුද?------
(විහාරාධිපති ස්වාමීන් වහන්සේ / උපාසක තැන / පොඩි හාමුදුරුවෝ )
**ආවාස ගෙය යන්න හඳුන්වන්න**---------------------------------------------------

10-බෝධි පූජාව පවත්වන පන්සලේ නම ලියන්න.--------------------------------------
( ගමේ පන්සල/ පරගොඩ පන්සල / දෙල්ගොඩ පන්සල)

11- පහත සඳහන් ඡේදවල හිස්තැන් පිරවීමට සුදුසු පද වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.

- මේ සංවාදය සකස් කර ගත්තේ මඩවල එස්. රත්නායක මහතාගේ--------------- කෘතියෙන්. එක් සහෝදරයකු නිවසින් පිටව යද්දී අනෙක් සහෝදර සහෝදරියන් වගකීම් භාර ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවක්.
- ටී.බී. ඉලංගරත්න මහතා විසින් රචනා කරන ලද------------------ නවකතාව ඇසුරෙන්. නවකතාවට අනුව නිමල් සහ පියා අතර ඇති වූ කතාබහක් තමයි දැන් ඉදිරිපත් කළේ.
- දැඟකාර ජපන් දැරියක හා අසිරිමත් පාසලක් පිළිබඳව ලියැවුණු ජපන් ජාතික ටෙට්සුකෝ කුරොයානගි ලියූ ලීලානන්ද ගමාච්චි මහතා පරිවර්තනය කළ-------------------------- කියන පොත

( **හරි පුදුම ඉස්කෝලෙ** / **අක්කර පහ** / **අඹ යහළුවෝ** )

12-
දහම් පාසලේ පැවැත්වෙන උදය රැස්වීම ආරම්භ කිරීම සඳහා ප්‍රධානාචාර්යතුමාට ආරාධනා කරමින් එතුමා සමග කරන කතා බහ ඇසුරෙන් සංවාදයක් නිර්මාණය කරන්න.

13-“ මම අද මේ දරුවන්ට පැහැදිලි කරන්නට සූදානම් වෙන්නේ අදහස් හුවමාරු කර ගැනීමේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු ගැන යි.------------------------------------- ------------ එන්න පන්තිය ඉස්සරහට. මම දැන් මේ හතර දෙනාට භාර දෙනවා සකස් කර ගත් සංවාද හතරක්. සංවාදය ඉදිරිපත් කරන්න යහළුවනුත් සම්බන්ධ කර ගන්න.”

**මේ ඡේදයේ ඇති හිස් තැනට යෙදෙන නම් පිළිවෙළට ලියන්න**.
(ඉඳුනිලුත්, චාමින්දත් පූර්ණිමාත්, මහේන්ද්‍රත්,)

14-තුන්වැනි සංවාදය කියවා එවැනි සංවාදයක් ගොඩ නගන්න.--------------------------------
------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------

15-සංවාද හතර කියවා වඩාත් සිත්ගත් සංවාදය තෝරා ගෙන, එය ඔබේ සිත් ගැනීමට හේතු වූ කරුණු තුනක් ලියන්න .
------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------

T.S.D.E.O Bandarawela